**ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුලි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.55,000,000 ක ප්‍රතිපාදනවලින්, අතිකාල හා නිවාඩු දින වැටුප්(1002) වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු. 3,741,177 ක් හා සම්මාදම් හා දායක මුදල් වෙනුවෙන් වෙන් කළ (1505) තිපාදනපුයෙන් රු.43,875,969 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 53ක් හා සියයට 91 ක් ඉතිරි වී තිබුණි. | වියදම් පාලනය සම්බන්ධයෙන් 2023.02.02 දිනැතිව නිකුත් කරන ලද 02/2023 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛය සහ පුනරාවර්තන වියදම් 6%කින් කපා හැරීම සම්බන්ධයෙන් 2023.01.27 දිනැතිව නිකුත් කරන ලද 01/2023 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් පාලනය කිරීමට කටයුතු කිරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරිය සිදුවී ඇත.එමෙන්ම වාහන කුලියට හෝ ලීසිං පදනම මත ලබා නොගෙන, අත්‍යාවශ්‍ය වාහනවල අලුත්වැඩියාවන් පමණක් සිදු කර භාවිතයට ගෙන ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට හා ප්‍රතිපාදන අදාළ කාර්යයේ යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මෘදුකාංග සංවර්ධනය සඳහා වැය විෂයය අංක 293-2-1-2106 යටතේ සලසා තිබුණු රු.5,000,000 ක ප්‍රතිපාදනවලින් සියයට 50 ක් එනම් රු.2,501,177 ක් උපයෝජනය කර නොතිබුණි. | 2023 වර්ෂයේ මුල් මාස දෙක තුළ දී අදාළ ප්‍රසම්පාදන කටයුතු දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් හරහා ආරම්භ කරන ලද අතර, ඉදිරිපත් වූ ලංසු අතරින් සුදුසුකම් ලත් පුද්ගලික ආයතනය වෙතින් රු.4,353,300/- ක (වැට් රහිත) මුදලකට අදාළ කාර්ය ඉටු කරවා ගැනීමට තීරණය කරන ලදි.<br>උපදේශන සේවා සැපයුම්කරු පත්කිරීම 2023 අගෝස්තු මාසය දක්වා ප්‍රමාද වූ බැවින් අදාළ කාර්යයේ සියලු නිමැවුම් සංවර්ධනය කර සම්පූර්ණ කිරීමට අදාළ ආයතනය අපොහොසත් වූ බැවින්, සංවර්ධනය කර අවසන් වූ පළමු හා දෙවන නිමැවුම් සඳහා පමණක් ඊට අදාළ මුදල වූ රු.2,498,823/-ක මුදල ගෙවා ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට හා ප්‍රතිපාදන අදාළ කාර්යයේ යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2022 ජනවාරි 25 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 හි 02 (ආ) ඡේදය | ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම ඵලදායි වන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 හි 02 (ආ) මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි එවැනි වාහන අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම කඩිනමින් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක දෝෂ පැවතීම මත වසර 02 ට වැඩි කාලයක සිට අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුව සතු, KO-8627 සහ 32-7486 අංක දරන වාහන අලුත්වැඩියා කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය ලබා ගැනීම සඳහා යොමු කර ඇත. | අලුත්වැඩියා කර ධාවන තත්ත්වයට පත් කර ගත හැකි වාහනවල අලුත්වැඩියාවන් කඩිනමින් නියමිත පරිදි නිමකරවා ගෙන ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 04 ත් වර්ෂ 09 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 07 ක් සම්බන්ධයෙන් එකතුව රු.2,086,351 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම අලාභ හානි සිදු වී තිබූ සිද්ධීන් 07න් මු.රෙ. 103 සහ 104 පරීක්ෂණ සිදු නොකර තිබූ සිද්ධි 02ක් සම්බන්ධව සිදු කළ පරීක්ෂණවල අවසන් අදියරේ පවතින අතර සිද්ධි 03ක් සම්බන්ධව නීති උපදෙස් සඳහා යොමු කර ඇත. තවත් එක් සිද්ධියක් සම්බන්ධව වැරදිකරුගෙන් අය කර ගැනීමට හා අනෙක් සිද්ධිය සම්බන්ධව අධිකරණයේ නඩු කටයුතු විභාග වෙමින් පවතින බැවින් එම නඩු කටයුතු නිම වන තෙක් තබා ඇත. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කාර්යක්ෂමව හා ඵලදායීව කටයුතු කළ යුතුය. |

## 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු රු.66,700,000 ක් වටිනා පර්චස් 75ක ඉඩමක් දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ රු.59,304,347 ක් ගෙවා මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මෙම ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණු අතර වසර 14 කට වැඩි කාලයක් ගත වුවද  මෙම ඉඩම කිසිඳු ඵලදායි කාර්යයක යොදවා නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිල දී ගත් ඉඩම විධිමත්ව පවරා ගැනීමට 2019 වර්ෂයේදී කටයුතු කළ අතර, ඒ අනුව 2020 අගෝස්තු 28 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩම පවරා දීමට ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇති අතර, ඒ අනුව මිනුම් කටයුතු 2024 පෙබරවාරි මස සිදු කර ඇති අතර, මෙතෙක් පිඹුර ලැබී නොමැත. ඉදිකිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලා ඇතත් භාණ්ඩාගාරයෙන් ලැබී නොමැත. | වසර 14කට පෙර ගෙවීම් කරන ලද මෙම ඉඩම් අප්‍රමාදව පවරාගෙන අවශ්‍ය ඉදිකිරීම් සිදු කර එම වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික්ක 15 ක වගාකරුවන් 32,563 ක් සඳහා රබර් නැවත වගාව සහ නව වගාව වෙනුවෙන් ලබාදුන් වගා සහනාධාර මුදලින් වගාව අතහැර දැමීම නිසා වගාකරුවන් 3,544 කගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.126,306,217 ක් අයවිය යුතුව තිබුණු නමුත් එම මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම සහනාධාර මුදල් අය කර ගැනීම සහ කපා හැරීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සංයුතියෙන් යුක්ත කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | රබර් වගා සහනාධාර ලබාගෙන වගාව අතහැර දැමීමට හේතුවූ කරුණු පරීක්ෂා කර නැවත සහනාධාර ලබා දීමේදී එම අඩුපාඩු අවම කර ගැනීමට හා අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රබර් ඉඩම් සම්බන්ධව 2010/2011 වර්ෂයට පසුව සංගනණයක් සිදුකර නොතිබුණු අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 කාර්යසාධන වාර්තාව අනුව රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 138526 ක් ලෙස දක්වා ඇතත් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 98,583.56 ලෙස දක්වා තිබුණි. | 2022 වසර දක්වා ශ්‍රී ලංකාවේ රබර් ඉඩම් ප්‍රමාණය ගණනය කරන ලද්දේ 2010/2011 වසර තුළ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයේ රබර් ඉඩම් ප්‍රමාණය පදනම් කර ගනිමින්, ඒ ඒ වර්ෂයේ නව වගා භූමි ප්‍රමාණය එකතු කිරීමෙන් හා වගාවෙන් ඉවත් වූ බිම් ප්‍රමාණය අඩු කිරීමෙන් ඇස්තමේන්තු අගයක් වශයෙනි. ජනලේඛන හා | රබර් වගාකර ඇති ඉඩම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි තොරතුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | | සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා සම්බන්ධිතව රබර් ඉඩම් සංගණනයක් සිදුකිරීමට මූලික කටයුතු සිදුකර තිබූ අතර, අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමේ ගැටලු සහගත තත්ත්වයක් හේතුවෙන් එය ක්‍රියාත්මක වී නැත. | |
| (ඇ) | රබර් වගාවේ පවතින පත්‍ර පතන රෝගය සඳහා 2023 වසර තුලදී ප්‍රාදේශීය කාර්යාල වෙත කාබෙන්ඩසිම් සහ හෙක්සාකොනසෝල් දිලීර නාශක දෙක පිළිවෙලින් කිලෝග්‍රෑම් 835 ක් සහ කිලෝග්‍රෑම් 52ක් ලබා දී ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සියයට 60 කට වඩා වැඩි බිම් ප්‍රමාණයක රෝගය ව්‍යාප්තව ඇති බැවින් රෝග මර්ධන වැඩපිළිවෙලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගෙන නොතිබුණි. මෙම දිලීර නාශකවලින් පිළිවෙලින් කිලෝග්‍රෑම් 597 ක් සහ කිලෝග්‍රෑම් 22.87ක් 2024 ජනවාරි 31 වන විටද ප්‍රාදේශීය කාර්යාල වල ඉතිරි වී තිබුණි. | ගොවීන්ගේ කැමැත්ත මත ප්‍රතිකාර කළ හැකි සියළුම ඉඩම් සඳහා මේ දක්වා ප්‍රතිකාර කර ඇති අතර, මෙම රෝගය පාලනය සඳහා අවශ්‍ය උපදෙස් නිරන්තරයෙන් ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදීම තුළින් ගොවීන් දැනුවත් කිරීමේ කටයුතු නිරන්තරයෙන් සිදු කරනු ඇත. | මිලදී ගෙන ඇති දිලීර නාශක කල් ඉකුත් වීමට පෙර භාවිතා කර පත්‍ර පතන රෝගය ව්‍යාප්තිය මර්ධනය සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| **(ඈ)** | වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලින් ලැබී වසර 08 සිට 12 දක්වා කාලයක් ගත වී තිබුණු මෙම දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහන 03ක් හා යතුරුපැදි 16 ක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබා දී ඇති මෝටර් වාහන 03 සහ යතුරුපැදි 16 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ නමට ලියාපදිංචි කර ඇති බැවින්, එම වාහන දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. | දෙපාර්තමේන්තුව වෙත ලැබී භාවිතා කරනු ලබන මෙම වාහන හා යතුරුපැදිවල අයිතිය පවරා ගැනීමේ කටයුතු නොපමාව කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 05 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 01 ක් සඳහා 2021 වර්ෂයේ සිට නිලධාරීන් අනුයුක්ත කරවා ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු සහකාර අධ්‍යක්ෂ තනතුරු 05ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 01ක් සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු අතර, එම පුරප්පාඩු සම්බන්ධව අදාළ අමාත්‍යාංශය දැනුවත් කර ඇති නමුත් මේ දක්වා නිලධාරීන් ලබා දී නැත. | කාර්යමණ්ඩල පුරප්පාඩුවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන පරිපාලන අංශ සමඟ සාකච්ඡා කර බඳවා ගැනීමේ කඩිනම් කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියට ඍජුවම දායක වන ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් 9 ක්ද රබර් සංවර්ධන නිලධාරීන් 61 ද පුරප්පාඩුව පවතින අතර 2021 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල රබර් සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු වැඩිවීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය විය. | රබර් සංවර්ධන නිලධාරීන් බඳවා ගැනිමට 2021 වර්ෂයේදී විභාගයක් පවත්වන ලද අතර, එහි ප්‍රතිඵල මත 2022 වර්ෂයේ බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතව තිබුණි. නමුත් 2022 වර්ෂයේ සිට රජයේ පත්වීම් ලබාදීම සීමා කිරීම මත, ඉහත විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ 06 දෙනෙකු පමණි. ඒ අනුව විශ්‍රාම යාම, සේවයෙන් ඉල්ලා අස්වීම වැනි හේතු නිසා ඇතිවී තිබෙන මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රජයෙන් අනුමැතිය ලබා නොදීම මත රබර් සංවර්ධන නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව වැඩි වී ඇත. | කාර්යමණ්ඩල පුරප්පාඩුවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන පරිපාලන අංශ සමඟ සාකච්ඡා කර බඳවා ගැනීමේ කඩිනම් කළ යුතුය. |